වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව
ගාල්ල දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 02 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 22 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි.

### 1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

සභාව සතු පර්චස් 139.1 ක් වූ ගොරකන්ද නිසලගම ඉඩමෙහි වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.30,110,884 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා හා ශේෂ සනාථ කිරීමේ සහතික විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,150,951 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,723,316 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 අක්කර බදු

------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගත යුතුව තිබූ රු.130,038 ක අක්කර බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු. 274,917 ක උසාවි දඩ හා රු. 4,227,265 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

#### 2.2.3 කඩ කාමර බදු

----------------

ඇත්කඳුර කඩ කාමර බදු දීම පිළිබඳව සිදු කරන ලද විගණන පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ගිවිසුමේ 04 වන කොන්දේසිය අනුව බදු ගත් දේපල අතුරු බදු නොදිය යුතු වුවද කඩ කාමර අංක 4 හා 5 මාසිකව රු.3,000 කට අතුරු බදු දී තිබුණි.

(ii) ගිවිසුමේ 10 වන කොන්දේසිය ප්‍රකාර බදුකරු විසින් තමා බදුගෙන ඇති කඩ කාමරයේ සූදු ක්‍රීඩාවක් පවත්වාගෙන යාම හෝ පැවැත්වීමට සැලැස්වීම නොකළ යුතුය යනුවෙන් දක්වා තිබුණ ද, කඩ කාමර අංක 13 හි බදුකරු විසින් රේස් බුකියක් පවත්වාගෙන යනු ලබන බවත් කඩ කාමර 12 ක් වසා දමා ඇති බවත් නිරීක්ෂණය විය.

#### 2.2.4 ඇත්කඳුර සතිපොල ගාස්තු

--------------------------------

ඇත්කඳුර සතිපොල පිළිබඳව 2014 පෙබරවාරි 06 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) කඩ කුටියකින් අය කළයුතු ගාස්තුව හෝ වෙළඳාම මත අය කළයුතු ගාස්තුවක් පිළිබඳ සභා තීරණයක් හෝ ගැසට් නිවේදනයක් ප්‍රකාශයට පත්කර නොතිබූ අතර, වෙළඳාම අනුව නිශ්චිත ගාස්තුවක් අයකර නොතිබුණි.

(ii) සතිපොල ආදායම් එකතු කරන නිලධාරී වෙත ප්‍රධාන කාර්යාලයෙන් නිකුත් කර තිබූ පොල බදු කුවිතාන්සි පොත් වල ප්‍රධාන කාර්යාලයේ මුද්‍රාව තබා නොතිබුණි.

(iii) කඩකුටි වෙළඳාම් කිරීමට යොදා නොගෙන, ඉන් ඉදිරිපිට කුඩාරම් ඉදිකර වෙළඳාම් කර තිබූ අතර තොග රැස් කිරීමට හා පාපැදි ගාල් කර තැබීම සඳහා ද යොදාගෙන තිබුණි.

(iv) කඩ කාමර නිසි පරිදි ඉදිකර නොතිබීම, අළුත්වැඩියා නොකිරීම හා වෙළෙඳුන්ට අවශ්‍ය පහසුකම් නොලැබීම නිසා කඩ කුටි 20 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**2.2.5 දුරකථන විදුලි සංදේශ කුළුණු ගාස්තු**

-----------------------------------------

සභා බලප්‍රදේශය තුළ ඉදිකර තිබූ දුරකථන විදුලි සංදේශ කුළුණු පිළිබඳ 2014 පෙබරවාරි 14 දින කරන ලද විගණන පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) නාගරික සංවර්ධන අධිකාරියේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ගැසට් නිවේදනයේ සඳහන් පරිදි සෑම කුළුණක් සඳහාම අනුකූලතා සහතිකයක් ලබා ගතයුතු අතර, එසේ ලබාගෙන නොමැති නම් අනුකූලතා සහතික නොමැතිව භාවිතා කිරීම අනුමත කර වසරක් ඉක්ම වූ දින සිට සභාවෙන් සංශෝධනයක් කර නොමැති නම් එක් දිනකට රු.50 බැගින් දඩ අයකල යුතු විය. ඒ අනුව සභා බලප්‍රදේශයේ ඉදිකර, භාවිතයට ගන්නා කුළුණු 03 ක් සඳහා රු.15,000 ක අනුකූලතා ගාස්තු හා රු.237,450 ක දඩ අයකර නොතිබුණි.

(ii) පෞද්ගලික ආයතනයක් විසින් නමුනුකුලවත්ත අකුරටියේ ඉදිකල දුරකථන විදුලි සංදේශ කුළුණට පෙරසැරි ගාස්තු ගෙවීමේ දී රු.20,000 ක මුදලක් ගෙවීමට යටත්ව 2009 පෙබරවාරි 05 දින ආවරණ අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවත් 2014 පෙබරවාරි මාසය දක්වාත් එම මුදල සභාවට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

**(අ) කසල කළමනාකරණය**

----------------------------

සභාවේ කසල කළමනාකරණයට මෙන්ම මාර්ග නඩත්තුව හා වීථි පහන් නඩත්තු කටයුතු සඳහා ටිපර් රථයක අවශ්‍යතාවය සභාපතිවරයා විසින් 2012 සැප්තැම්බර් 03 දින පුරනැගුම පළාත් ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත දැනුම් දී තිබුණි. ඒ අනුව 2013 සැප්තැම්බර් 11 දින රු.3,450,574 ක් වූ කියුබ් 2 ක ටිපර් රථයක් සභාවට ලබා දී තිබුණි. නමුත් සභා බලප්‍රදේශය තුල පිහිටි පටු මාර්ගවල මෙම රථය ධාවනය කිරීමට අපහසු බව සභාපතිවරයා විසින් 2013 ඔක්තෝබර් 08 දින පළාත් ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත දන්වා යවා තිබුණි.

**(ආ) වත්කම් හා බැරකම් නීත්‍යානුකූලව පවරා නොගැනීම**

---------------------------------------------------------

වත්කම් බැරකම් බෙදාදීමේ කමිටුවේ නිර්දේශ මත කරන්දෙණිය ප්‍රාදේශීය සභාව විසින් වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවට පැවරිය යුතු ලෙසට තීරණය කර තිබූ රු.4,606,306 ක වත්කම් සහ රු.2,740,757 ක බැරකම් පාදක කරගෙන ගිණුම් පිළියෙල කර තිබුණ ද, විගණන දිනය වූ 2014 අප්‍රේල් 11 දින වනවිටත් අදාළ වත්කම් හා වගකීම් නීත්‍යානුකූලව ප්‍රාදේශීය සභාව වෙත පවරාගෙන නොතිබුණි.

**4. පද්ධති හා පාලන**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් පරිපාලනය
(ආ) වත්කම් කළමනාකරණය